# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2271/27 - 2022 මාර්තු මස 15 වැනි අඟහරුවාදා - 2022.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

සභාවේ අවසරය නොලබා, සභාවේ සාමාන්‍ය රැස්වීම් තුනකට සහභාගී නොවීම හේතුකොට ගෙන මඩකලපුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 66අ(1) (අ) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ අංක 16 මඥ්ජන්තොඩුවායි කොට්ඨාසයට තේරී පත් වූ මොහමඩ් උසනාර් මොහමඩ් නිෆ්ලර් අයත් වන්නා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම මඩකලපුව මහ නගර සභාවේ අංක 16 මඥ්ජන්තොඩුවායි කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අබ්දුල් කාදර් මොහමඩ් ලතීෆ් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මඩකලපුව මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි, මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් අබ්දුල් කාදර් මොහමඩ් ලතීෆ් මඩකලපුව මහ නගර සභාවේ අංක 16 මඥ්ජන්තොඩුවායි කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම්. සුෆ්යාන්,**
තේරීම්භාර නිලධාරි,
මඩකලපුව මහ නගර සභාව.

2022 මාර්තු මස 15 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

EOG 03 - 0901


1A - G 36382 — 20 (2022/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*